35 වන පිටෙන්

අලෙවියද දුටිමු. අවුරුදු සිය ගණනකට පෙර ලැබුණු රන්මිශ්‍ර ශෛලමය කැබලි දැක්වෙන කෞතුකාගරයක් එහි වීය. සියලු දෑ නැරඹීමෙන් පසු බෙහෙවින් ආශ්වාද ජනක වු අසුන් සිව්දෙනෙකු යෙදු රථයකද සුළු වේලාවක් ගමන් කිරීමේ අවස්ථාව උදාවිය. පසුව ආපන ශාලාවකින් සප්පායම් වී කුසගිනි නිවා ගත් අපි නිවස කරා ගමන් කලෙමු.

අපගේ අවසාන සංචාරය වුයේ මෙල්බන් නගරයේ පිහිටි මින් මැදුරු නැරඹීමය. සිරිලක සත්වෝද්‍යානයේ පිහිටි මින් මැදුරට වඩා බෙහෙවින්ම වෙනස් වුවකි. මුහුදේ එක් කොටසක තනා ඇති මෙය ස්වභාවිකව මින් මැදුරක් බව මට පෙනුණි. අලංකාර මත්ස්‍යයන්ගෙන් ගහන වු එය දුටුවන් නෙත් සිත්



පිනවන සුළුය. අයිස් කදුමත සිට දියඹට පැන පීනමින් ජල ක්‍රීඩා කරන පෙන්ගුවින් නම් මත්ස්‍ය පෙළ දුටු අපට ඇතිවුයේ ඉමහත් ප්‍රීතියකි. මත්ස්‍ය වර්ග විශාල ප්‍රමාණයක් අපට මෙහිදී දක්නට ලැබුනි. නා නා පැහැති මසුන් වර්ග පීනා යන අයුරු ඉතා අලංකාර දර්ශනයක් විය. මුහුදු අශ්වයන් හා මුහුදු පිඹුරන් ද අති විශාල මඩුවන් හා මෝරුන්ද අපි නිරීක්ෂණය කලෙමු.

සයමසක් පමණ දිගු කාලයක් දරුවන් සමග ගතකල අපට ශ්‍රී ලංකා ධරණී තලයේ පහස ලබන දිනය ලං වන බව පෙනේ. ඔවුන්ගෙන් වෙන්ව යන ඒ දුක්බර මොහොතේදී -පියෙහි විප්ප යෝග දුක්ඛෝ" යන බුදුදවස මා සිහියට නැගෙයි. බුදු දහම පිළිබඳ පොතපත නිතර පරිශීලනය කරන මට ප්‍රියන්ගෙන් වෙන්වීමේ දුක මෙලොව උපන් සියලු සතුනට උරුම වන සනාතන දහමක් බව පසක් වී ඇත. අටලෝ දහමට අනුව දුක සැප දෙකම මැදහත් සිතින් වින්දනය කළයුතු බව මගේ හැඟීමයි. ජීවිතයේ යථාර්තය එය බැව් මම දකිමි

අනාගතයේ කෙදිනක හෝ සිය දිවි පෙවත ගෙන යම සදහා ඔවුනගේ මවුරට වෙත පැමිණෙවි යන මගේ අපේක්ෂාවයි. එහෙත් ඒ දිනය උදවන විට මා ජීවතුන් අතර සිටිදැයි අවිනිශ්චිතය.







